# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.
## නිවිතිගල අධ්‍යාපන කලාපය.
### 9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

| | |
|---|---|
| සතිය | **පළමු සතිය (2021-01-03 සිට 2021-01-09)** |
| ක්‍රියාකාරකම | ලන්දේසි ආසියාවට පැමිණීම හා බැඳුණු විවිධ සාධක සොයා බලමු |
| හැඳින්වීම | පෘතුගීසීන්ගෙන් පසු පෙරදිග ප්‍රදේශ වල බලය තහවුරු කරගත් මීළඟ යුරෝපීය ජාතිය වන්නේ ලන්දේසීන් වේ. මහනුවර රාජධානි සමයේ මෙරට පාලන බලතල හෙබවූ දෙවන රාජසිංහ රජු පෘතුගීසීන් මෙරටින් නෙරපා දැමීම සඳහා ලන්දේසි සහාය පැතීය. 1638 එම රජුන් සමඟ ගිවිසුම් ගතවන ලන්දේසි රජු සමග එකතුව 1658 දී පෘතුගීසීන් මෙරටින් පලවා හරින ලදී එතැන් පටන් 1796 වෂර්ය දක්වා මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතේ පාලනය විය. එම පාලන අවධියේ ආර්ථික දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳ මෙහිදී අවධානය යොමු කරනු ලැබේ. |

**ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්**

| | |
|---|---|
| පියවර 1 | මේ ශ්‍රේණියේ පෙළ පොතේ ඒකකය එක පිටුවක් 1 සිට 20 දක්වා හොඳින් කියවා ගන්න. |
| පියවර 2 | ඔබ විසින් සපයා ගත් පොතෙහි ඉහතින් සඳහන් කර ඇති පාඩමේ ඒකකයේ නම සඳහන් කරගන්න |
| පියවර 3 | පිටු අංක 1 හා 3 උපකාර කොට ගෙන හත ක්‍රියාකාරකම තම සටහන් පොතෙහි සිදු කරන්න. |

**ක්‍රියාකාරකම 1 -ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න**

| | |
|---|---|
| 1. පෘතුගීසීන් ආසියාවෙන් ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය අලෙවි කළ වරාය කුමක්ද | ලන්දේසි |
| 2.පෘතුග්‍රීසීන් ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය මිලදී ගත් ප්‍රධාන යුරෝපීය ජාතිය | ඕලන්දය |
| 3. ලන්දේසීන්ගේ මව් රට | රෙපරමාදු |
| 4.ස්පාඤ්ඤ ජාතිකයන් කුමන ආගමික කණ්ඩායමක් ද | ලිස්බන් |
| 5. ලන්දේසීන්ගේ ආගම | රෝමානු කතෝලික |
| 6. ලන්දේසින්ට ලිස්බන් වරාය තහනම් කළ රජතුමා | VOC |
| 7. ඕලන්ද වෙලඳ සමාගම | ii වන පිලිප් |
| 8.පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය | පෘතුගීසීන් |
| 9. බෙතාවිය පිහිටියේ | බතාවිය |
| 10.ලන්දේසීන් පැමිණෙන විට පෙරදිග ප්‍රදේශ තුළ බලය මෙහෙය වූ යුරෝපීය කණ්ඩායම | ජාවා දූපත |

සැකසුම -උදාර අරවින්ද

ර/නිවි/අධ්‍යාපන කලාපය

ර/කලවාන ජාතික පාසල